# මී වද තිත්ත වූ වලස් පුංචා



ආර්.එම්.සෙනුරි තත්සරණී රත්නායක

# මී වද තීත්ත වූ වලස් පුංචා

ආර්.එම්.සෙනුරි තත්සරණි රත්නායක.

කර්තෘ ප්‍රකාශනයකි.

ප්‍රථම මුද්‍රණය-2023

## කතුවරියගේ වෙනත් කෘති;

නරි රාලට පාඩමක්

හිත හොඳ ඇත්

*ISBN NO – ISBN 978-624-206-758-2*

**කෘතිය පල කරන දිනය - 2023 11 15**

# පිදුම

මෙම පොත සෑදීමට  මා හට නිරන්තරයෙන් ශක්තියක් වූ මාගේ දෙමාපියන්ටත්,සහෝද්ර , සහෝද්රියන්ටත්,පන්තිභාර ගුරු මැණියන්ටත්, උපදෙස් ලබාදුන් සෙනවිරත්න සර්ටත් මෙම පොත ගෞරවයෙන් පුදමි.

# පෙරවදන

වත්මත් අධ්‍යාප්තයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥා සම්පත්ත දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුර වැසියන් සහිත සමා ජයක් ගොඩ නැඟීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතාහඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැ ඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුම කරගත් මහමායාදියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබු සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩ නැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් දිවිය දිනත විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදා යක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාප්ත අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමී

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරු භවතුන් දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නත් අයුරින් උදව් උපකාර කළ සැමට හෘ දයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත් කරමින් එයට ජීවයක් වූ සෙනවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20



වලස් තාත්තාටයි වලස් අම්මාටයි පුංචි පුතෙක් හිටියා. එයාට ආදරේට කියන්නේ වලස් පුංචා කියලයි.



වලස් පුංචා හරි දගකාරයි.ඒ නිසා
අම්මායි,තාත්තායි දෙන්නා මී වද
කඩන්න යන විට පුතාට හැමදාම
අවවාද කරනවා "පුතා කොහෙවත්
තනියම ඇවිදින්න යන්න එපා,අපි
ඉක්මනට එන්නම්."



පුංචාට අවවාද කළ වලස් අම්මයි, වලස් තාත්තයි එදත් සුපුරුදු විදියට මී වද කඩන්න වනයට ගියා.

මී වද කඩාගෙන රස බලන්න වලස් පුංචාට හිතුණා.



"තාත්තට මී වද කඩන්න පුළුවන් නම් මට මොකද බැරි ?" යැයි කියූ වලස් පුංචා ගහ දිගේ අමාරුවෙන් උඩට නැග්ගා.

ඉන්පසු වලස් පුංචා මී වදේ ළඟට කිට්ටු වුණා . එවිට මී වදය ඇවිස්සෙන්නට ගත්තා.



අනේ, මී මැස්සෝ වලස් පුංචාට අනින්න ගත්තා.

වලස් පුංචගේ ඇගේ හැමතැනම විෂ දළ ඇනිලා එයා වේදනාවෙන් දගලන්න වුණා. දෙමව්පියන් දුන් අවවාදය පුංචාට මතක් වුණේ දැනුයි.



වලස් පුංචා අඬ අඬ ගෙදර දුවගෙන ආවා. හති අරිමින් මිදුලේ නතර වුණු වලස් පුංචා බිම ඉදගෙන අඬන්න ගත්තා.



වලස් අම්මයි, තාත්තයි වලස් පූංචාට පෙර ගෙදර ඇවිත්,වලස් පූංචා හැමතැනම හොයනවා.අඬ අඬා දුවමින් මිදුලේ නතර වූ වලස් පූංචාව දැක්ක මේ දෙන්නා කලබලයට පත් වුණා.



එතකොටත් මී මැස්සෝ වලස් පුංචාව වටකරගෙන අනිනවා අම්මයි ,තාත්තයි මී මැස්සන්ට අතින් පහර දී එලවාදමා වලස් පුංචාව බේරාගත්තා.

"කියන දේ අහන්නේ නැතිව වැඩ කළාම ඔය වගේ කරදර සිද්ධ වෙනවා."වලස් පුංචාව තුරුල් කර ගත් වලස් අම්මා කිව්වා.



" මීට පස්සෙ මම කවදාවත්
අකීකරු ව වැඩ කරන්නේ නැහැ"
වලස් පුංචා අම්මටයි තාත්තාටයි
පොරොන්දු වුණා.ඊට පස්සෙ
වලස් පුංචයි, වලස් අම්මයි, වලස්
තාත්තයි සතුටින් ජීවත් වුණා.



ඉතින් යාලුවනේ අපි මේ කතාව අපේ ජීවිතයට ආදර්ශමත් කරගෙන පුංචි අපිත් හොඳ පුරුදු ඇති කර ගනිමු.

නිමි.

# පසුවදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔනෑවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝද්‍යක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ වනපෘතිය හඳුන්වාදෙන ලදී. ඒ යටතේ වඩිම ගුන්ථ ප්‍රමානයක් රචනාකරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතක තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායාදියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිව්‍යය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසී ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20